පුනරුත්ථාපන කාර්යාංශය
புனர்வாழ்வுப் பணியகம்
BUREAU OF REHABILITATION
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு
MINISTRY OF JUSTICE, PRISON AFFAIRS AND CONSTITUTIONAL REFORMS

අංක: 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල.
இல: 462/2, கடுவெல வீதி, கனஹேன, பத்தரமுல்ல.
No: 462/2 ,Kaduwela Road , Ganahena , Battaramulla.

මගේ අංකය / எனது இல / My No: BR/PROC/HQ/2024/075

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2024. 05 . 21

......................................

......................................

......................................

මහත්මයාණෙනි,

මිල කැඳවීමේ නිවේදනය සහ ටෙන්ඩර් කොන්දේසි : වර්ණාලේප කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම

1. අධිකරණ, බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කාර්යාංශය වෙතින් මෙයට ඇමුණුම "අ" යටතේ දක්වා ඇති උපලේඛණනය අනුව එහි සඳහන් භාණ්ඩ/සේවාව සැපයීම සඳහා මිලගණන් කැඳවනු ලැබේ.

2. මිලගණන් කැඳවනු ලබන දිනය සහ වේලාව : මෙම මිලගණන් 2024. 06. 04 දින 1030 පැයට වසනු ලැබේ.එම දින එම වේලාවෙන් පසුව මිලගණන්පත් භාර ගනු නොලැබේ. මෙම දින නියමිත වේලාවට පසුව ඉදිරිපත් කරනු ලබන මිලගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. මිලගණන්පත් වලංගු කාලය : සියලුම මිලගණන්පත් අවම වශයෙන් ඒවා විවෘත කරන දින සිට දින 60ක් ඉදිරියට වලංගු විය යුතුය.

4. ඔබගේ මිලගණන්පත් පහත සඳහන් කොන්දේසි යටතේ ඉදිරිපත් කළ යුතුය.

අ. මිල නියම කරන භාණ්ඩ/සේවාව උසස් ප්‍රමිතියකින් යුක්ත විය යුතුය.

ආ. සැපයුම්/සේවාව සඳහා මුදල් ගෙවීම සිදු කරනු ලබන්නේ භාණ්ඩ/සේවාව සැපයීමෙන් දින 14 කට පසුවය.

5. එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචිය: දේශීය වශයෙන් භාණ්ඩ භාරදීම/සේවාව සඳහා මිලගණන් ඉදිරිපත් කරනු ලබන සියළුම ලංසු තබන්නන් එකතුකල අගය මත බදු වෙනුවෙන් (VAT) ලියාපදිංචිය තිබිය යුතුය. එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන් අදාල භාණ්ඩ/සේවාව සඳහා බදු ගෙවීම අදාළ නොවේ නම් ඒ සඳහා අදාළ වන පනතේ ගැසට් නිවේදනය අනුව වත්මන් මුදල් වර්ෂය වෙනුවෙන් ආදායම් බදු දෙපාර්තුමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් සහතික කර ආයතනයේ නමට ලබාගත් සහතිකයේ ඡායාපිටපතක් ඉදිරිපත් කළ යුතුය.

6. මිලගණන් ඉදිරිපත් කිරීම: ලංසු තබන්නන් විසින් මිලගණන් ඉදිරිපත් කිරීමේදී මෙම මිල කැඳවීමේ නිවේදනයේ සඳහන් කොන්දේසි වලට එකඟ විය යුතුය. ආයතනය වෙතින් ඉදිරිපත් කරනු ලබන සියළුම මිලගණන්පත් හා ඊට අදාළ ලේඛන ආයතනයේ නිළ මුද්‍රාව සහිතව අවසරලත් නිළධාරියෙකු විසින් නිසි පරිදි අත්සන් කර ඉදිරිපත් කළ යුතුය. එම උපදෙස් වලට පරිබාහිරව ඉදිරිපත් කරනු ලබන මිලගණන්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිලගණන් වසනු ලබන දිනයේ හෝ එම වේලාවට ප්‍රථම මුද්‍රා තැබූ මිලගණන්පත් 2024. 06 . 04 දින පෙ.ව 1030 ට ප්‍රථම අංක 462/2, කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ ගෙනවිත් භාරදිය හැක. තවද ෆැක්ස් මගින් හා විද්‍යුත් තැපැල මගින් ලැබෙන මිලගණන්පත් භාරගනු නොලැබේ.

7. ඉදිරිපත් කරනු ලබන මිලගණන්පත් පිටපත් 02කින් යුතුව ටෙන්ඩර් කොන්දේසි වලට එකඟ වන බවට අත්සන් තබා ඉදිරිපත් කිරීමට හැක. මිළකැඳවීමට අදාළ භාණ්ඩයේ සියලුම කාර්මික තොරතුරු (Technical Literature) පාරිභෝගික අත්පොත හෝ රූප සටහන් (Pamphlets and drawing) අදාළ වන පරිදි මිලගණන්පත සමඟ අමුණා එවිය යුතු අතර යන්ත්‍ර වාහන හා උපකරණ වෙනුවෙන් විකිණීමෙන් පසු සේවා කිරීම, සේවා ස්ථාන සහ වෙනත් විශේෂ සේවාවන් පිළිබඳ සියළු විස්තර ඇතුළත් විය යුතුය.

පොදු / பொது / General: +9411 2577457, +9411 2883891
ෆැක්ස් / தொலைநகல் / Fax: +9411 2883737, +9411 2883899
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: bcg.rehabilitation@gmail.com
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.bcgr.gov.lk

**8.** <u>නියැදින් (Sample) ඉදිරිපත් කිරීම</u>: නියැදින් සැපයිය යුතු බවට මිල කැඳවීමේ නිවේදනයේ සඳහන් කර ඇත්නම් අන්වාර්යයෙන්ම සියළුම පිරිනැමීම් සඳහා නියැදින් ඉදිරිපත් කළ යුතුය.එම නියැදීන් මත ආයතනයේ නම සහ පිරිනැමුම් අංකය නොමැකෙන ලෙස සටහන් කර මිලගණන් විවෘත කිරීමට නියමිත දින එම වේලාවට හෝ ඊට ප්‍රථම භාර දිය යුතුය. නියමිත දින නියමිත වේලාවට පසුව ඉදිරිපත්කරනු ලබන නියැදින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. නියැදීන් වෙනුවට වෙනත් ලියකියවිලි එනම් ගුවන්භාර බිල්පත් භාරගනු නොලැබේ.

අ. සාම්පල වශයෙන <u>01</u> බැගින් ඉදිරිපත් කරන්න.

**9.** <u>මිලගණන්පත් විවෘත කිරීම</u>: ඉදිරිපත් කර ඇති සියලුම මිලගණන්පත් වසනු ලබන දිනය සහ වේලාව අවසානයේදී එම ස්ථානයේදීම විවෘතකරනු ලබන අතර, එම දිනයේදී මිලගණන් විවෘත කරන ස්ථානය වෙත ලංසු තබන්නාට හෝ බලයලත් නියෝජිතයෙකුට පැමිණීමට අවකාශ ඇත.

**10.** <u>ප්‍රසම්පාදන කමිටු අයිතිය:</u> ඉදිරිපත් කරනු ලබන මිලගණන්පත් සම්පූර්ණ හෝ කොටස් වශයෙන් පිලිගැනීමක් සිදු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව/පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් සතුවන අතර, එම තීරණය අවසාන තීරණය වේ. සාර්ථක සැපයුම්කරුවන් වෙත නිල වශයෙන් දැනුම් දීමක් සිදු කරන අතර, තෝරා නොගත් සැපයුම්කරුවන් සබැඳිව කිසිදු දැනුම්දීමක් සිදුකරනු නොලැබේ.

ඒඑම්ඩබ්ලිව්පී අබේසේකර
ලුතිතන් කර්නල්
ප්‍රසම්පාදන නිළධාරී
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට

මම/අප විසින් ඉහත සඳහන් ටෙන්ඩර් කොන්දේසි සඳහා එකඟ වන අතර මා/අප වෙත ටෙන්ඩර් ප්‍රධානය කරනු ලැබුවහොත් භාණ්ඩ/සේවාව නිවැරදි පිරිවිතරයට හා ප්‍රමිතීන්ට අනුව මාගේ මිලගණන්පතෙහි දක්වා ඇති සැපයීම් කාලසීමාව හෝ ලබා දෙනු ලබන කාලසීමාව තුළදී සැපයීමට මා/අප සමාගම ක්‍රියාකරනු ලබන බවට එකඟ වනු ලැබේ.

..................................................
අත්සන

..................................................
ඉහත සඳහන්කර ඇති අයගේ සම්පූර්ණ නම

..................................................
ආයතනයේ නම

..................................................
ආයතන නිළ මුද්‍රාව

BR/PROC/HQ/2024/075 හා 2024.05.21 දින ලිපියට ඇමුණුම "අ" වශයෙනි.

<u>දේශීය වශයෙන් භාරදෙනු ලබන භාණ්ඩ/සේවා සඳහා මිලගණන් උප ලේඛණය</u>

වර්ණාලේප කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීම

| අ:අ | මිලදී ගත යුතු භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | වෙළඳනාමය | වගකීම් කාලසීමාව | ඒකක මිල (රු.) | සම්පූර්ණ මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| 1. | Weather Shield Paint (Butter Milk) | 70 Ltr | | | | |
| 2. | Emulsion Paint (Butter Milk) | 140 Ltr | | | | |
| 3. | Epoxy Floor Brush (Red) | 10 Ltr | | | | |
| 4. | 10" Roller Brush | 4 | | | | |
| 5. | 4 ½ Brush | 2 | | | | |
| 6. | 2 ½ Brush | 2 | | | | |
| 7. | Tinner /Turpentine | 5 Ltr | | | | |
| එකතුව රු. (වැට් රහිත) | | | | | | |
| 18% වැට් බදු | | | | | | |
| ප්‍රවාහන ගාස්තු | | | | | | |
| මුළු එකතුව රු. (වැට් සහිත) | | | | | | |

1. මිල වලංගු කාල සීමාව (දින 60ක් හෝ ඊට වැඩි) :......................................................

2. භාණ්ඩ සැපයීමට ගත වන කාලය : ......................................................
   සැ.යු: ටෙන්ඩරය අනුමත වුවහොත් මිලදී ගැනීමේ ඇණවුම නිකුත් කළ දින සිට දින 14ක් ඇතුළත අදාළ භාණ්ඩ අංක 462/2, කඩුවෙළ පාර, ගනහේන බත්තරමුල්ල දරණ ලිපිනයෙහි ස්ථාපිත පුනරුත්ථාපන කාර්යාංශය වෙත ගොස් භාර දීමට ක්‍රියා කළ යුතුයි)

3. ප්‍රවාහනය සම්බන්ධ තොරතුරු: ......................................................

4. ආයතනයේ නම : ......................................................

5. ලිපිනය: ......................................................

6. දුරකථන අංකය: ......................................................

7. ෆැක්ස් අංකය: ......................................................

8. විද්‍යුත් තැපැල් ලිපිනය: ......................................................

9. එකතු කල අගය මත බදු ලියාපදිංචි අංකය: ......................................................

10. සාම්පල ඉදිරිපත් කර ඇති/නැති බව :......................................................

(සාම්පල ඉදිරිපත් කිරීමට නොහැකි මෙම අයිතමයන් සඳහා හොඳින් නිරීක්ෂණය කළ හැකි වර්ණ ඡායාරූපය

බැගින් ඉදිරිපත් කිරීමට කාරුණික වන්න.)

11. ආයතනයේ නිල මුද්‍රාව :......................................................

**12.** ලංසු ඉදිරිපත් කරන්නාගේ අත්සන:..........................................................................................

**13.** ලංසු ඉදිරිපත් කරන්නාගේ නම:..........................................................................................

**14.** දිනය:..........................................................................................................................

**15.** මිල කැඳවීමේ නිවේදනය ලබාගත් ආකාරය :..........................................................................

සැලකිය යුතුයි:

- වට්ටම් මුදලක් ලබාදෙන්නේ නම් එම වට්ටම් මුදල අඩු කර මිලගණන් ඉදිරිපත් කළ යුතුයි.
- විද්‍යුත් තැපැල් හා ෆැක්ස් මාර්ගයෙන් ලැබෙන මිල ගණන්පත් නොසලකා හරිනු ලැබේ.
- විමසීම **:011-2883891**
- මිලගණන්පත් පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය හැකිය.
  අංක **:462/2,** කඩුවෙල පාර, ගනහේන, බත්තරමුල්ල

ඒඑම්ඩබ්ලිව්පී අබේසේකර
ලුතිතන් කර්නල්
ප්‍රසම්පාදන නිළධාරී
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙනුවට